# මහමංගල සූත්‍රයෙන් පෙන්වා දෙන සමාජානුයෝජන කාරකයන් පිළිබඳව අධ්‍යයනය

මහාකච්චිකොඩියේ පඤ්ඤාසේකර හිමි

නූතන මානව සමාජය සංකීර්ණ වූ චර්යා පද්ධතියකින් යුක්ත සමාජයකි. එය විමසුම් ඇසින් බලන කල පුද්ගලයකු සමාජයේ ජීවත් කරවන්න සුදුසු වන ආකාරයට නොව මානවයාගේ චර්යාවන් සකස් වී ඇත්තේ මානවයාගේ පැවැත්මට හානි කරවන ස්වභාවයෙනි. එය සමාජ පැවැත්මට මහත් ගැටලුවකි. මෙවැනි ස්වභාවයකින් මිදීමට නම් සමාජානුයෝජන ක්‍රියාවලිය ක්‍රමවත්විය යුතුය. එය ක්‍රමවත් කරගැනීමට බුදු දහමෙන් පෙන්වා දී ඇති ආදර්ශයන් පිළිබඳව අවධානය යොමු කිරීම මෙම අධ්‍යයනයේ දී අපේක්ෂා කරනු ලැබේ.

සමාජානුයෝජනය (Socialization) යනු පුද්ගලයා සමාජයට අනුගතවීමේ ක්‍රියාවලිය අර්ථකතනය කරන්නකි. තොටිල්ලේ සිට මරණය දක්වා පුද්ගලයකු සමාජයට අනුගතවීමේ දී එම පුද්ගලයාට ඔහු ඇසුරු නිසුරු කරන සමාජයේ පවතින ආචාර ධර්මයන් හා පරිකල්පණයන් හේතුවේ. ටැල්කට් පාෂන් (Talcott Parson) නම් සමාජ විද්‍යාඥයා පෙන්වා දෙන්නේ සමාජයේ බලපවත්වනු ලබන යම් යම් සාරධර්ම ආකල්ප පිළිබඳව ඉගෙන ඒවා තමාගේ චරිතය තුළම අභ්‍යන්තරිකරණය කරගැනීමේ ක්‍රියාවලිය සමාජානුයෝජනය ලෙසටය.[2] එමෙන්ම එමිල් ඩුර්කයිම් (Emile Durkheim)නම් සමාජ විද්‍යාඥයා සමාජානුයෝජනය අර්ථකතනය කරන්නේ පුද්ගලයා තම ක්‍රියා, ආකල්ප සමාජයේ විද්‍යමාන යම් යම් රටාවන්ට අනුකූලව හැඩගස්වා ගැනීමේ විධිමත් පටිපාටිය ලෙසටයි.[3]



සමාජානුයෝජනය පිළිබඳව විඤ්ඤාණමය අවබෝධ මත පදනම්ව අධ්‍යයනයක නිරතවන C.H. කූලි අර්ථකතනය කරන්නේ අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාවන් කෙරෙන් හටගනු ලබන විඤ්ඤාණමය අවබෝධය මත පදනම් වූ ක්‍රියාවලිය සමාජානුයෝජනය ලෙසටය.[4]

සමාජානුයෝජනය පිළිබඳව බටහිර සමාජ විද්‍යාඥයන් පෙන්වා දී ඇති අර්ථකතනයන් දෙස බැලීමේ දී පැහැදිලි වන්නේ පුද්ගලයකු සමාජයට අන්තර්ගත වීමේ ක්‍රියාවලිය සඳහාණී ජීවත්වන ඒ සමාජයේ ආචාර ධර්ම, ආකල්ප, සමාජයේ පවත්නා යම් යම් රටාවන් හා විඤ්ඤාණගත දැනුම අභ්‍යන්තරීකරණය කර ගැනීම හේතුවන බවයි. පුද්ගලයකු සමාජයට අනුගත වීමේදී එම සමාජයේ පවතින ස්වභාවයන් තුළින් පෞරුෂය ගොඩනන්වා ගන්නවා සේම සාංසාරික වශයෙන් ඇතිකරගත් පුරුදු මත ද පුද්ගලයකු තම හැසිරීම් යම් යම් සමාජයන්වල ප්‍රතිමානය කරන බව මහාචාර්ය නන්දසේන රත්නපාල මහත්මා බෞද්ධ චින්තනයට අනුව සමාජානුයෝජනය ගැන කෙරෙන විග්‍රහයේ දී පෙන්වා දී ඇත. ඔහුගේ විස්තරයේ මෙසේ ප්‍රකාශ වේ.

> "කාලය නියම කොට දැක්විය නොහැකි භවගාමී පැවැත්මක් පිළිබඳ සංකල්පය නිසා සමාජානුයෝජනයට බෞද්ධ ඉගැන්වීම්වලින් සාංසාරික සංදර්භයක් එක්වෙයි. පුද්ගලයාගේ උපත නැවත නැවතත් සිදුවන විට එක් භවයකින් ආනෙකකට සමාජානුයෝජනයේ ප්‍රතිපලය ගෙනයෑමක් සිදුවේ. කෙනෙකුගේ ක්‍රියා කලාපයන්හි කර්ම විපාක වශයෙන් ඊළඟ භවයට ගෙනයයි. මේ අනුව සමාජානුයෝජනය පුද්ගලයාගේ ජිවිතය උපතකින් උපතකට සම්බන්ධ කෙරේ.[5]"

එමෙන්ම මව්කුස තුළ පිළිසිඳගත් විඤ්ඤාණය කෙමෙන් කෙමෙන් වර්ධනය වනවිට මවගේ හා පියාගේ හැඟීම් හා

චර්යාවන් ද යම් ආකාරයක බලපෑම් කරනු ලබයි. කෙසේවෙතත් සමාජානුයෝජනයේ දී අවධානය යොමු කරනු ලබන්නේ පුද්ගලයකු මෙලොව එළිය දුටුවිට ඔහු හෝ ඇය ජීවත්වන සමාජයට අනුගතවීමේ ක්‍රියාවලිය පිළිබඳවය. ඕනෑම පුද්ගලයකුගේ ශාරීරික ස්වභාවයන්, ගති, ආකල්ප හැසිරීම් ආදිය එම පුද්ගලයාගේ ජෛවීය ආවේණිය මඟින් ස්වභාවිකවම එම පුද්ගලයා තුළ අභ්‍යන්තරීකරණය වුවත් මෙකී ආවේණික කායික හා මානසික ගති ලක්‍ෂණ හා ආකල්ප රටා වර්ධනයවීම, නිෂ්ප්‍රභාවීම, නොවෙසේනම් පරිවර්ථනයට බඳුන්වීම සිදුවනුයේ සමකාලීන සමාජ හා සංස්කෘතික පරිසරය එම පුද්ගලයාට බලපානු ලබන ආකාරය අනුවයි.[6] මේ අනුව පෙනී යන්නේ සමාජානුයෝජනයේ දී කර්මය, ආරය මෙන්ම පරිසරය යන සාධක බලපෑම් කරන බවය. නමුත් සමාජානුයෝජනයේ දී වැඩියෙන්ම අධ්‍යයනයට ලක්වන්නේ පරිසර සාධකවල බලපෑම පිළිබඳවයි. විශේෂයෙන්ම ජීවත්වන පරිසරය තුළ යහපත් සමාජානුයෝජනයකට අවශ්‍ය සාධක තිබිය යුතුය. ඒ සඳහා බුදු රජාණන් වහන්සේ විවිධ දේශනා මඟින් මග පෙන්වා ඇත. ඒ අතරින් **සදිසා නමස්කාරය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, ශීල සංකල්පය, සතර සංග්‍රහ වස්තු, සිව්බඹ විහරණ,** දස **රාජ ධර්ම,** දස **සක්විති වත්** ප්‍රධාන වේ. සමාජානුයෝජන ක්‍රියාවලිය ප්‍රධාන අංශ දෙකක් යටතේ සිදුවන්නකි.

1. ප්‍රාථමික සමාජානුයෝජනය. Primary Socialization
2. ද්විතීයික සමාජානුයෝජනය. Secondary Socialization.

**ප්‍රාථමික සමාජානුයෝජනයේ** Primary Socialization දී පුද්ගලයකු මුලින්ම අනුගතවන සමාජ කාරකය වන්නේ පවුලයි. එහිදි මවට හා පියාට දරුවකු සමාජයට හුරුකිරිමේ ලා ප්‍රධාන වගකීම පැවැරී ඇති බව දිසානමස්කාර සංකල්පය තුළින් ද බුදු දහම ප්‍රකට කර ඇත.[7] ළදරුවා උපත ලද දින සිට ක්‍රමයෙන් සමාජයට හුරුවීමේ ක්‍රියා දාමය ප්‍රාථමික සමාජානුයෝජනයේ දී සිදුවේ. ළදරුවෙකු පළමුවෙන්ම කරනු ලබන්නේ කෑ ගැසීමයි. එසේ කෑ ගැසිමෙන් ඔහු බලාපොරොත්තු වන්නේ මව් කුසේ දී හැඟීම්වලින් කරන ලද ගනුදෙනුව මවත් සමඟ සිදුකර ගැනීමය.



මවගේ අවධානය ගැනීමට ළදරුවා කෑ ගසන ආකාරය දැකිය හැකිය. තමන්ගේ අවශ්‍යතාවයන් ඉටුකරගැනීමට කෑ ගැසීමේ දී මව එය ඉටුකර දේ. එය ඔහුට ඉගෙනීමක් බවට පත් වේ. කෑ ගැසීමත් සමඟ සිනාසෙන්නටත් ඔහු හුරු වේ. මෙය ළදරුවෙකු මාස 36 ක වැනි කාලයක් පුරාවට සිද්ධ කරනු ලැබේ.[8] මේ කාලය පුරාවට ළදරුවෙකු මව සහ පියා මූලික කරගෙන සහයෝගයෙන් කටයුතු කරනු ලබයි. මෙු අනුව පැහැදිළි වන්නේ පුද්ගලයකු සමාජානුයේජනයේ දී මූලිකවම පවුල මුල් කරගෙන එය සිදුවන බවය.

පවුල මුල් කරගත් සමාජානුයෝජන ක්‍රියාවලියේ දී පුද්ගලයාගේ යහපත් පෞරුෂ වර්ධනයක් සඳහා බුදු දහමෙන් මඟපෙන්වීම් සිදුකර ඇත. එම ධර්මතාවයන් වලින් පරිපූර්ණ වු සමාජානුයෝජනයක් ඇතිවුවහොත් ඔහු යහපත් මෙන්ම ධාර්මික සත්පුරුෂ පුද්ගලයකු බවට පත්වේ. එයට අවශ්‍ය මඟපෙන්වීම සදිසා නමස්කාරයෙන් පෙන්වා දී ඇත. සදිසා නමස්කාරයෙ දී නැගෙනහිර දිසාව මව්පියන් හා දූ දරුවන් අර්ථ ගන්වන අතර එහි දී ඔවුනොවුනගේ යුතුකම් හා වඟකීම් පිළීබඳව විශේෂ අවධානයක් ගෙන තිබේ. යහපත් සමාජයකට අවතීරණය කිරීමේ මූලික පරමාර්ථයෙන් කටයුතු කරන මව්පියන් තම දරුවා කෙරෙහි දැක්විය යුතු වඟකීම් සිඟාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරයෙන් පෙන්වා දී ඇත. එයට අනුව තම දරුවාව පළමුවෙන්ම පවින් වැළක්වීම කළයුතුයි **(පාපා නිවාරෙන්ති).** එනම් දරුවෙකුගේ සිත සෑම මොහොතකම පිරිසිදු නිසා කිළිටි වීමේ අවස්ථාවෙන් මුදවා ගැනීමට දෙමාපියන් උත්සහා කළයුතුයි. පාප ක්‍රියාවන් පිළිබඳව මෙන්ම පාපයෙන් සිදුවන විපාක පිළිබඳවද දරුවට අවබෝධයක් ලබාදිය යුතුයි. පාපයෙන් මෙන්ම පාප මිත්‍ර සේවනයෙන් ද මුදවා ගන්නා දරුවා ඉන් අනතුරුව කල්‍යාණ මිත්‍ර ආශ්‍රයට පත් කිරීමේ කාර්යද දෙමාපියන් සතු වඟකීමක් වේ **(කල්‍යාණේ නිවේසෙන්ති).** ළදරු අවධියේ සිටම දරුවාට හොඳ දේ කිරීමට පුරුදු කළයුතුය. නරක දෙයින් මුදවා ගතයුතුය. එසේ නරක දෙයින් භයානක විපතක් සිදුවන බව ඔහුට අවබෝධ කරවීමෙන් ඔහු ඒ දෙයින් නිතරම මිදිමට

උත්සහාගනි. එයින් ඔහුගේ පෞරුෂයට යහපත් දේ පමණක් කිරීමට පුරුද්ද ඇතිවේ. නරක දෙයක් කිරීමේ දී ඇතිවන විපත මතකතබා ගැනීමට හැකිවන ආකාරයට කථාවක් ආකාරයෙන් කියාදීමේ ස්වභාවයක් දැකිය හැකිය. එමෙන්ම යහපත් දේවල් කිරීමෙන් සිදුවන සතුට සැනසීම ද විවිධ කතා අනුසාරයෙන් කියා දේ. ඒ නිසාම අතීතයේ සිංහල ජන සමාජයේ වීර කතා, සුරංගනා කතා, වැනි ළමයින්ගේ අවධානය දිනාගතහැකි සේම ඒ තුළින් ඔවුන්ට ආදර්ශයක් ගොඩනඟාගත හැකි කතා ප්‍රබන්ධ වී තිබුණි. ඒ සියල්ලෙන් උත්සාහ කරන්නේ පාපයෙන් මුදවා ගැනීමටත් යහපතේ යෙදවීමටත් ය. එමෙන්ම ප්‍රාථමික සමාජානුයෝජන ක්‍රියාවලියේ දී පවුල නැමැති කාරකය තුළ දරුවා සිල්ප ශාස්ත්‍රයට යොමු කිරීමේ **(සිප්පං සික්ඛාපෙන්ති)** වගකීම පැවැරෙන්නේ ද දෙමාපියන්ටය. සුදුසු කාලයට සුදුසු ස්ථානයක සුදුසු ගුරුවරයෙක් යටතේ අධ්‍යාපන ලබා ගැනීමට දරුවාව යොමුකළ යුතුයි. එපමණක් ද නොව ආර්ථික හා සාමාජීය වශයෙන් ද දෙමාපියන්ගේ වගකීම් මෙහි දී අවධාරණය කෙරේ. ධනය දායද කිරීමත් **(සමයේ දායජ්ජං නියයාතෙන්ති)** අනාගතයෙහි යෙදිය හැකි ශිල්පයක පුහුණුකරවීමත් දරුවාගේ ආර්ථික පදනම ස්ථාවර තත්වයක තැබීමය. පැවැත්ම සඳහා අවශ්‍ය වනුයේ සුදුසු ආවාහ විවාහ සම්බන්ධතා දරුවාට ඇතිකර දීමයි **(පතිරූපෙන දාරෙන සංයොජෙන්ති)**. මේ තුළින් මැනවින් සමාජයට හුරුවන දරුවාට ස්වකීයමය වු චර්යාවන් ගොඩනඟාගෙන ද්වතීක සමාජානුයෝජන ක්‍රියාවලියේ උපරිම ප්‍රයෝජන ගැනීමට අවස්ථාව සැළසේ. බුදු දහමේ අනුදත් පරම් පරා තුනකින් යුත් විස්තෘත පවුල මේ ක්‍රියාකාරීත්වයට නොමඳ අවස්ථා සපයයි.[9]

පවුල නැමැති සමාජ ඒකකයෙන් ලබන සමාජ උගැන්ම මවගෙන් හා පියාගෙන් පමණක් නොව පවුලේ හිතවතුන්, සොයුරු සොයුරියන්, මිත්තණිවරුන් ඔස්සේද පුද්ගලයා අභ්‍යන්තරීකරණය කරගන්නා බව **එම්. නිම්කෝප්** (Nimcoff) නම් මනෝ සමාජ විද්‍යාඥයා පවසයි.[10] පවුල මඟින් පුද්ගලයා තුළ ඇතිකරනු ලබන උගැන්ම හා ශික්ෂණය ගිලින් හා



බෝවර්මන් (Gellen and Bowarmen) නම් මනෝවිද්‍යාඥයන් දෙදෙනා විසින් කරුණු කකිහිපයක් ඔස්සේ පෙන්වා දී ඇත.[11]

1. ශරීර වතාවත් විධිමත්ව හුරුකිරීම.
2. පරිසරය තේරුම් ගැනීමෙහිලා ඉවහල්වන සමාජ ආකල්ප ඇති කිරීම.
3. ජන සන්නිවේදන මාධ්‍යයන් සමඟ සම්බන්ධතා පැවැත්වීමට හුරුකිරීම
4. වැඩිහිටි දාරක පරතරයෙහි විෂමතා අකාමකා දමා ඒ වෙනුවට ආරක්ෂාව පිළිබඳව හැඟීම් දරුවා තුළ ඇති කිරීම.

දරුවෙකු පවුල ආශ්‍රයෙන් පරිබාහිරව අත්දැකීම් ලබන තවත් පුද්ගලයකු හෝ ස්ථානයක් තිබේ නම් එය **ද්වීතීක සමාජානුයෝජනයට** Secondary Socialization අයත් කාර්යයකි. එහිදී ආගමික ආයතන, වෘත්තීමය ආයතන, අධ්‍යාපනික ආයතන මෙන්ම මිතුරු කණ්ඩායම් ඉතා වැදගත් වේ. ප්‍රාථමික සමාජානුයෝජනයේ දී ඉතා වැදගත් ස්ථානයක් ලෙසට පවුල හැඳින්විය හැකිය. පවුල තුළදී ලද හොඳ දේවල් පිළිබඳ දැනුම හා අවබෝධය තහවුරු කරගැනීමත් සිදු කරගනු ලබන්නේ පාසලෙනි. **ජීන් පියාජේ** Jean Piaget නම් අධ්‍යාපන මනෝ විද්‍යාඥයා මෙම අදහස පැහැදිළි කරමින් පවුල හා සමාජය යන ලෝක දෙක අතර අන්තර් මාධ්‍ය මධ්‍යස්ථානක් වශයෙන් පාසල පුද්ගලයා සමාජයට අනුයෝජනය වු උදාර පුරවැසියකු බවට පත් කරන්නේ යැයි පවසා ඇත.

> "නිවස තුළදි මව්පියන් විසින් හොඳ යැයි කියු බෝහෝ දේ පාසලේ ගුරුවරුන් විසින් ක්‍රියාත්මක කර පෙන්වනු දකින ළමයා එයට වහා බැඳේ. ඒ බැඳීම පෙරළා ඔහුගේ සිතේ ඇති කරගන්නේ උද්දාමයකි. තමා උදාර මිනිසෙකු බවටපත් වී පාසලේ ගුරුවරුන්ගෙත්, නිවසේත්, මව්පියන්ගෙත් ආදරය හා ගෞරවය ලබාගත

යුතුය. යන දැඩි ඕනෑකම ඔහුගේ සිතට නිරායාශයෙන්ම පිවිසෙයි."[12]

පාසලේ දී දරුවෙකුට මුණගැසෙන ගුරුවරයාත් සමවයස් යහළුවනුත් ඉතා වැදගත් සමාජානුයෝජන කාරකයන් වේ. එම නිසා පුද්ගලයකු යහපත් චරිතයකින් යුක්තව සමාජගත වීමට අවශ්‍ය ධර්ම කාරණා බුදු දහමින් මනාව පෙන්වා දී ඇත. සිඟාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරයේ දී ගුරුවරුන් හා ශිෂ්‍යන් අතර පවතින යුතුකම් හා වගකීම්වලින් කෙතරම් දුරට ගුරුවරයකු ශිෂ්‍යාව සමාජගත කිරීමට උත්සාහකල යුතු ද යන්න පෙන්වා දී ඇත. එහි දී ගුරුවරයකු අතින් ඉටුවිය යුතු යුතුකම් කිහිපයක් පෙන්වා දේ. එනම්, මැනවින් හික්මවිය යුතුවේ **(සුවිනීතං විනෙන්ති)**. හොඳින් උගන්වයි **(සුග්ගහිතං ගහපෙන්ති)**. උගත් සියලු ශිල්ප කියාදේ **(සබ්බ සිප්පයුතං සමක්ඛායිනො භවන්ති)**. මිත්‍රාමාත්‍යන් කෙරෙහි පිහිටුවති **(මිත්තා මච්චෙසු පටියාදේන්ති)**. සියලු දිසාවන් හී ආරක්ෂාව සලස්වයි **(දිසාසු පරිත්තානං කරොන්ති)**[13] යනුවෙනි. මෙහි දී ගුරුවරයා තම ශිෂ්‍යාව පළමුව මැනවින් හික්මවා ගැනීම සිදුකරනු ලබයි. එය දඬුවමින් හා ආදරයෙන් යන දෙයංශයෙන්ම සිදු වේ. විශේෂයෙන්ම පළමුව ආදරයෙන් හික්මවා ගැනීමට උත්සාහ කිරීම ගුරුවරයකුගේ පූර්ණ වගකීමයි. එසේ නොවුනහොත් සුළු දඬුවමකින් හික්මවාගත යුතුය. එය දරුවෙකුට දරාගත හැකි විය යුතුය. අමානුෂික නොවිය යුතුයි. අමානුෂික දඬුවමින් දරුවෙකු හික්මවා ගැනීමට යාම තුළ ඔහු හිතුවක් කාර ප්‍රචණ්ඩ පුද්ගලයකු බවට පත්විය හැකිය. එම නිසා ගුරුවරයා මනා කොට තම ශිෂ්‍යා පිළිබඳව අවබෝධ කරගෙන ඔහු හික්මවා ගනිමින් සියලු ශිල්ප කියා දී යහළු මිත්‍රාදීන්ට හඳුන්වාදීමේ ක්‍රියාවලිය සමාජගතවන දරුවාට යහපත් පෞරුෂයක් ගොඩනගා ගැනීමට මහත් අස්වැසිල්ලක් වන්නේය. එම ක්‍රියාවලිය දරුවාගේ ජීවිතයේ මංගල කාරණාවන් වනබව ද දේශනා කොට ඇත.

**බාහු සච්චං ච ශිප්පං ච - විනයෝ ච සුසික්ඛිතෝ**
**සුභාසිතා ච යා වාචා - ඒතං මංගල මුත්තමං.**[14]



සමාජානුයෝජනයේ දී සමවයස් ආශ්‍රය ද ඉතා වැදගත් කාරකයක් වේ. පවුල් පරිසරියෙන් පසුව පුද්ගලයා අවතීරණය වන්නේ පාසල හා සමවයස් කණ්ඩායම් වෙතටය. සමවයස් කණ්ඩායම් සමඟ කටයුතු කිරිමේ දී තරමක වෙනස් අත්දැකීම් ලබයි. පවුල තුළදී තමාට ආධිපත්‍යයකට යට වී තීරණය ගැනීමට සිදු වුවත් මෙහිදී තරමක් නිදහසක් ලැබීමට හේතු වේ. ඔහු එහිදී සමවයස් අය අතර පවතින සම්මතයන්ට යම් යම් නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීමට උගනියි.[15] නිදසුනක් වශයෙන් දක්වතොත් මිතුරන් කිහිප දෙනෙක් එකට එකතු වී යම් කිසි ක්‍රියාවක් කරන්නේ නම් ඒ ක්‍රියාවට අනුකූලව අවශ්‍ය නීතිවලට ක්‍රියා කිරිමට සියල්ලන්ටම සිදු වේ. එම නීති රීති උල්ලංඝණය කරන්නා ක්‍රියාවෙන් ඉවත් කරනු ලැබේ. මෙවැනි සුළු අත්දැකීමක් වුවද එය ළමයාට සමාජයේ හැසිරීම් පිළිබඳව ගැඹුරු අරුතක් කියාපායි.

යහපත් පුද්ගලයකු බිහි කිරීමට ඇසුර හේතුවන බව බුදු දහමෙන්ද පෙන්වා දී ඇත. සිඟාලෝවාද සූත්‍ර දේශනාවේ උතුරු දිසාව නමස්කාර කිරීමෙන් මිත්‍ර ආශ්‍රය සංකේතවත් කරනු ලැබේ. මිත්‍ර ආශ්‍රයේ දී තම මිතුරාට දානයෙන් සංග්‍රහ කලයුතුය **(දනේන)**. ප්‍රිය වචනයෙන් සංග්‍රහ කලයුතුය **(පෙය්‍යවජ්ජේන)**. අර්ථ චරියාවෙන් සංග්‍රහ කිරීම **(අත්ථචරියා)**. සමානාත්මතාවය **(සමනාත්තතාය)** හා නොරැවැටීම **(අවිසංවදනතාය)** යන ධර්ම කාරණාවෙන් පෙන්වා දී ඇත. මෙම කරුණු හයෙන් සැළකුම් ලබන යහළුවා තම මිතුරාට ප්‍රතිඋපකාර දැක්විය යුතුය. එහි දි ඔහු කරුණු පහකින් තම මිතුරාට අනුකම්පා කරයි. තම මිතුරාගේ පමාදයකින් මත් වුයේ නම් ඔහු රැක ගනියි **(පමත්තං රක්ඛන්ති)**. මත් වූ මිතුරාගේ වස්තුව රැක ගනිත් **(පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛන්ති)**. උවදුරකට පැමිණියාහට පිහිට වෙත් **(භීතස්ස සරණං හොන්ති)**. විපතේ දී අත් නොහරී **(ආපදාසු න විජහන්ති)** ඔහුගේ දරුමුණුබුරන්ට මමත්වයෙන් සංග්‍රහ කරයි **(අපරප්ප වස්ස පටිපූජෙන්ති)**. මිත්‍ර ආශ්‍රයේ දී මෙවැනි මිතුරන් ආශ්‍රය කිරීමෙන් හා එවැනි මිතුරන් සිටින සමාජයට අනුගතවීම තුළ යහපත් සමාජයක් ගොඩනැගෙන බව බුදු රජාණන් වහන්සේ දේශනා

කර ඇත. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී මිතුරන් යනු සමවයස් කණ්ඩායම පමණක් සීමා නොකරයි. ඇසුරට සුදුසු බාල තරුණ හෝ මහළු සියල්ලෝම කළණ මිතුරෝ වෙති.

**...ගහපති වා ගහපති පුත්තො වා දහරා වා වුද්ධ සීලිනො වුද්ධා වා සීලා...**[17]

පුද්ගලයාට තම නිවස තුළ සිටින හොඳම මිතුරා තම මව බවත් හොඳම මිතුරිය තම බිරිඳ බවත් සමහර අවස්ථාවන්වල දී බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. එසේම මිතුරු සමාජයේ මිත්‍ර ප්‍රතිරූපකයන් සිටින බවද සිඟාලෝවාද සූත්‍ර දේශනාවේ දීර්ඝව සඳහන් වී ඇත. සැබෑ මිතුරන් ඔවුන්ගෙන් වෙන් කොට හඳුනාගත යුතුය. නැතහොත් වන්නේ විශාල පරිහානියකි.

පුද්ගලයකු යහපත් ආශ්‍රයකට නොවැටුණහොත් ඔහු එම සමාජයේ අයහපත් චර්යාවන්ගෙන් පෝෂණය වේ. එවිට ඔහුගෙන් සමාජ අපගාමී චර්යාවන් දකගැනීමට හැකි වේ. එවැන් අවස්ථාවන් බුදු දහමේ ජාතක කථාවලින් විද්‍යමාන වී ඇත. සත්තිගුම්බ ජාතකයේ දක්වෙන පරිදි සොරුන් ඇසුරුකළ ගිරා පැටියා ඉතා සැඩ පරුෂ වචනයෙන් කතාකළ අතර තවුසන් ඇසුරුකල ගිරා පැටියා කාරුණික වචනයෙන් කතා කළහ.[18] එමෙන්ම මහිලා මුඛ නම් ඇතා සොරුන්ගේ වචන අසා මිනීමරු ඇතකු වු බවත් සිල්වතුන්ගේ වචන අසා මුදු මොළොක් ඇතකු වූ බවත් සඳහන් වේ.[19] මේ සියලු දේශනාවලින් පැහැදිළි වන්නේ පුද්ගලයකුගේ චර්යා රටාව ඔහු ආශ්‍රය නිශ්‍රය කරන පුද්ගල සමාජට හේතුවන බවයි

තවද බුදු දහමේ සඳහන්වන, **ශීල**, සංකල්පය ද සමාජානුයෝජනයේ දී ඉතා වැදගත් ධර්මකි. සීලයෙන් විරමණය පමණක් නොව සමාදානයක්ද ඇතුළත් වේ.[20] නිදසුනක් ගතහොත් පංච ශිලයේ එන ප්‍රථම ශික්ෂා පදය ඝාතනයෙන් හා හිංසනයෙන් වෙන් වීමට සීමාවුවක් නොවේ. එහි ප්‍රාණ ඝාතනයෙන් ඈත්වීම, දඬු මුගුරු ආයුධ ඉවත් කිරීම, වරද කිරීමට ලැජ්ජාවීම පමණක් නොව කරුණාවෙන් යුක්තවීම සියලු සතුන් වෙත හිතවත් ලෙස හැසිරීම හෙවත් මෛත්‍රියෙන් ක්‍රියා කිරීම ද අන්තර්ගත වේ. බෞද්ධ සමාජයට හැඩ ගැසුණු පුද්ගලයා මිනිසුන්ද සතුන්ද නොමරයි. ඔවුන්ට හිංසාද නොකරයි. සියලු දෙනාට කාරුණික වේ. සියලු දෙනාම දුකින් විපතින් මුදවා ගන්නවා සේම සියලු දෙනාටම හොඳ මිතුරකුබවට පත් වේ. සීලයෙන් අපේක්ෂා කරන සමාජානුයෝජනය එයයි.[21]



සමාජානුයෝජන ක්‍රියාවලියේ දී බුදු දහමේ සඳහන්වන තවත් වැදගත් සංකල්ප දෙකක් ලෙස **සතර සංග්‍රහ වස්තුවත්, සිව්බඹ විහරණයත්** පෙන්වාදිය හැකිය. **දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය** සමාජය තුළ භාවිතයේ යෙදවීමෙන් එම සමාජය ජීවත්වීමට සුදුසු සමාජයක් බවට පත්වේ. එවැනි සමාජයක ඇසුරට එක්වන පුද්ගලයා ද එම ධර්මතාවයන්ට නිරායාශයෙන්ම පුරුදු පුහුණු වේ. **මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා** යන සිව්බඹ විහරණයයි. එයින්ද සමාජයට මෛත්‍රිය කිරීමත් කරුණාවෙන් යුතුව කටයුතු කිරිමත්, ඊර්ෂ්‍යා නොකර සියලු දෙනාටම සියලු දෙනා සමඟම මධ්‍යස්ථ භාවයෙන් කටයුතු කිරිමටත් පුද්ගලයා පුරුදු වේ. එය ද සමාජයකට අවශ්‍යම ගුණ ධර්මයකි. ඒ තුළින් ද යහපත් සමාජයක් ගොඩනඟාගත හැකිය. එපමණක් ද නොව **දසරාජ ධර්ම** හා **දස සක්විතිවත්** වැනි රාජ්‍ය මුල්කරගත් සමාජ ධර්මතාවයන් ද පුද්ගලයකුගේ යහපත් සමාජානුයෝජනයකට හේතුවන බව සක්සුදක් සේ පැහැදිලිය.

මේ අනුව පැහැදිළි වන්නේ සමාජයට අනුගතවන පුද්ගලයකු එම සමාජයට අනුගතවීමේ ක්‍රියාවලියක් අනිවාර්යෙන් අවශ්‍යවන බවයි. එවැනි අවස්ථාවක දී අනුගතවන සමාජයේ පවතින ලක්ෂණයන්වලට හා ධර්මතාවයන්වලට අනුරූපිව පුද්ගලයකු නිර්මාණය වේ. එය ප්‍රාථමික සමාජානුයෝජනයේදීත් ද්විතික සමාජානුයෝජනයේදීත් දකිය හැකි සාධාරණයකි. එම නිසා මෙම අවස්ථා දෙකේදීම පුද්ගලයකු සමාජගත කිරීමට අවශ්‍ය ධර්මතා බුදුරජාණන් වහන්සේගේ දේශානාවන්වල පැහැදිළි වී ඇත. පවුල මූලිකකරගත් සමාජානුයෝජනයේදී ඊට සරිලන ධර්මකාරණා මෙන්ම ඉන් බාහිර ගුරු ඇසුරේ මිත්‍රාදි ආශ්‍රයේ දී

පාලනය විය යුතු ස්ථාන හඳුනාගෙන අත්හලයුතු දේ අත්හැරීම වැළඳගතයුතු දේ වැළඳගෙන යහපත් පුද්ගලයකු තුළින් යහපත් සමාජයක් ගොඩනඟා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම බුදු සමය තුළ දැකිය හැකිය. එය සමාජානුයෝජනයේ දී ඉතා වැදගත් වේ.

## ආන්තික සටහන්


1. පසන් කොඩිකාරී (පරිවර්තනය), සමාජ විද්‍යාත්මක දැනුම න්‍යාය හා ව්‍යවහාරය, 2012, පිට 92.
2. දයා අමරසේකර, සමාජ විද්‍යා විමර්ශන, 2010, පිට 56.
3. දයා අමරසේකර, සමාජ විද්‍යා සිද්ධාන්ත හා විධික්‍රම, 2010, පිට 97.
4. -එම- පිට 99.
5. Nandasena Rathnapala, Buddhist Sociology, 1993, P 35.
6. දයා අමරසේකර, සමාජ විද්‍යා සිද්ධාන්ත හා විධික්‍රම, 2010, පිට 80.
7. දී.නි. 3, සිඟාල සූත්‍රය, පිට 305.
8. නන්දසේන රත්නපාල, සමාජ විද්‍යා මූලධර්ම, 2012, පිට 70.
9. ධර්මසේන හෙට්ටි ආරච්චි, බෞද්ධ සමාජ විද්‍යා ප්‍රවේශය, 2001, පිට 68.
10. දයා අමරසේකර, සමාජ විද්‍යා සිද්ධාන්ත හා විධික්‍රම, 2010, පිට 86.
11. Lapier Rebert, Social Psychology, 1942, New York, P 57.
12. Rock.J.S, Sociology of crime, 'Peter Owen Limited old Brompton Road, London, P 87.
13. දී. නි. 3, සිඟාල සූත්‍රය, පිට 304.
14. සු. නි, මංගල සූත්‍රය, 80 -83
15. දයා අමරසේකර, සමාජ විද්‍යා විමර්ශන, 2010, පිට 57.
16. දී. නි, 3 සිඟාල සූත්‍රය, පිට 306.
17. අ. නි 5, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, පිට 236.
18. ජාතක පාලි 2, සත්තිගුම්භ ජාතකය, පිට 36
19. ජාතක පාලි 1, මහිලාමුඛ ජාතකය, පිට 10.
20. Ven. Pategama Gnanarama, An Approach to Buddhist Social Philosophy, 1996, P 04.
21. ධර්මසේන හෙට්ටි ආරච්චි, බෞද්ධ සමාජ විද්‍යා ප්‍රවේශය, 2001, පිට 68.